**<u>නිපුණතාව 7 - ශ්‍රී ලංකාවේ යටත්විජිත පරිවර්තනයේ සමාජ,ආර්ථික හා දේශපාලන පැතිකඩ හඳුනා ගනියි.</u>**

**<u>නිපුණතා මට්ටම 7.1 - යටත්විජිත වාදය හා යටත් විජිත පාලන ක්‍රමය ලංකාවේ සමාජ,ආර්ථික හා දේශපාලන පරිවර්තනයට තුඩුදුන් ආකාරය විග්‍රහ කරයි.</u>**

**<u>7.2 - ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ ප්‍රතිවිපාක අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි.</u>**

1.) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ආයතනවල ක්‍රියාකාරීත්වය ගැන අදහස් දක්වන්න.

1.ආණ්ඩුකාරවරයා

2.අමාත්‍ය මණ්ඩලය

3.රාජ්‍ය මන්ත්‍රණ සභාව

2.)"රාජ්‍ය නිලධාරීන් තිදෙනා බ්‍රිතාන්‍ය ආණ්ඩුව ආරක්ෂා කළ මුර බල්ලන් තිදෙනෙකි.".ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ආශ්‍රයෙන් මෙම කියමන සනාථ කරන්න.

3.)ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ හඳුන්වා දෙන ලද විධායක කාරක සභා ක්‍රියාකාරීත්වය විවේචනාත්මකව විමසන්න.

4.)ඩොනමෝර් කොමිසම විසින් 1931 සර්වජන ඡන්ද බලය නිර්දේශ කිරීම කෙරෙහි බලපෑ හේතු සාධක විමසන්න.

5.)ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ විමසන්න.